www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලියෝ තොල්ස්තෝයිගේ අභාවයෙන් සිය වසරක්

## තොල්ස්තෝයි: පුනර්-කතිකාවක්

අප්‍රේල් 4 දා, කොළඹ මහවැලි කේන්ද්‍ර ශ්‍රවනාගාරයේ දී, ලියෝ තොල්ස්තෝයි පිලිබඳ මාක්ස්වාදී ඇගැයීමක් ඉදිරිපත් කෙරෙන දේශනයක් පැවැත්වෙන අතර මෙය සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ශිෂ්‍ය සංවිධානය වන සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) විසින් සංවිධානය කෙරේ.

රුසියානු හා ජගත් සාහිත්‍යය පෝෂනය කල අග්‍රගන්‍ය කලාකරුවෙකු වන තොල්ස්තෝයිගේ අභාවයෙහි ශත සංවත්සරය 2010 නොවැම්බර් මසට යෙදුනි. මෙම ශ්‍රේෂ්ඨ ලේඛකයාගේ ඇවෑමෙන් සියවසක් ගත වූ තැන පවා ඔහු අරබයා ව්‍යාකූල අදහස් ගොන්නක් රජයයි. මේ අලාමුලාව ජනනය කෙරී පවතිනුයේ සාහිත්‍යකලා ක්ෂේත්‍රයෙහි ආධිපත්‍යය දැරූ/දරන ඇතැම් ධනේශ්වර, සුලු-ධනේශ්වර, ස්ටැලින්වාදී හා වෙනත් නන්වැදෑරුම් ජනතාවාදී විචාරකයන්ගේ නන්දෙඩවිලි හා මුසා බස් කරනකොටගෙන ය. තොල්ස්තෝයි කෘතීන්හි බාල අනුවාද ද, තොල්ස්තෝයි පිලිබඳ ලෙනින්ගේ ලිපිවල සදොස් හා විකෘත පරිවර්තන ද අඩුවැඩි වශයෙන් ඊට දායක වී ඇත.

මෙයට ප්‍රතිකූලව, තොල්ස්තෝයිගේ සාහිත්‍යික කර්තව්‍යයන්හි සැබෑ අර්ථභාරයත් ඔහුගේ ජීවන දර්ශනයෙහි සැබෑ ස්වරූපයත් වටහාගත හැකි වනුයේ ලෙනින් පමනක් නොව ලෝක කම්කරු පන්ති ව්‍යාපාරයේ ප්‍රමුඛ නායකයන් වූ ට්‍රොට්ස්කි, ජෝර්ජි ප්ලෙඛානොව්, ෆ්‍රාන්ස් මෙහ්රිං, රෝසා ලක්සම්බර්ග් හා ඇලෙක්සැන්ඩර් වොරොන්ස්කි බඳු මාක්ස්වාදීන්ගේ සම්ප්‍රදායන් ඇසුරින් ම පමනි.

දශක ගනනාවක් මුලුල්ලේ තොල්ස්තෝයි පිලිබඳව වපුරන ලද දුර්මත ඇතුලු සෙසු ජුගුප්සාජනක හා වංචනික ප්‍රයත්නයන් අනාවරනය කරමින් තොල්ස්තෝයි නමැති සාහිත්‍යකරු හා චින්තකයා පිලිබඳ සම්භාව්‍ය මාක්ස්වාදී ඇගයුම තහවුරු කිරීම අදාල දේශනයෙහි මූලික අරමුන වන අතර එම කර්තව්‍යය ඉටු වනුයේ සකලවිධ ප්‍රතිගාමී බලවේගවලට එරෙහිව විප්ලවවාදී පක්ෂය ලෝක පරිමානව ගෙන යන්නා වූ අරගලයෙහි ම අවියෝජනීය කොටසක් හැටියට ය.

## ප්‍රසිද්ධ දේශනය

## දිනය: 2012 අප්‍රේල් 04 වෙනි බදාදා

### වේලාව: සවස 4.00 ට

## ස්ථානය: කොළඹ මහවැලි කේන්ද්‍ර ශ්‍රවනාගාරයේ දී

## දේශක: දර්ශන මේදිස්

## මෙහෙයවීම: සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ

© www.wsws.org